**72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව**
**දු.ක:** +94 11 231 4041/2/3/5 **ෆැක්ස්:** +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

# මාධ්‍ය නිවේදනය

**නිකුත් කිරීම**

දිනය: 2024 සැප්තැම්බර් 11

වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව.07.00


**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**
ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**
ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

## අගෝස්තු මාසයේ දී අනුර කුමාර දිසානායක සහ සජිත් ප්‍රේමදාස සියලුම වැඩිහිටියන් අතර ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රායෙන් පෙරමුණේ; ජනපති රනිල් වික්‍රමසිංහ සඳහා අඛණ්ඩ වර්ධනයක්


2024 *අගෝස්තු IHP MRP ජනාධිපතිවරණ යාවත්කාලීනය*

IHPහි ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේ (SLOTS) 2024 අගෝස්තු මස සඳහා වන ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය පිළිබඳ තාවකාලික MRP ඇස්තමේන්තුවලින් පෙනී යන පරිදි, සැප්තැම්බර් ජනාධිපතිවරණයට පෙර ජා.ජ.බ./ ජ.වි.පෙ. නායක අනුර කුමර දිසානායක සහ ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාස සියලුම වැඩිහිටියන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රායෙන් පෙරමුණ ගෙන ඇත. ප්‍රධාන පක්ෂ හතරෙහි කිසිදු ජනාධිපති අපේක්ෂකයෙකුට වැඩිහිටි ඡන්දදායකයන්ගෙන් බහුතර බලයක් ලබා ගැනීමට නොහැකිව ඇත. ඡන්දදායක සහයෝගයෙන් 32%ක් ලැබූ සජිත් ප්‍රේමදාස, 28%ක් සහයක් ලැබූ ජනපති රනිල් වික්‍රමසිංහ සහ 3%ක සහයක් ලැබූ නාමල් රාජපක්ෂ අභිබවමින්, ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමර දිසානායක සියලු වැඩිහිටියන්ගෙන් 36%ක ප්‍රතිශතයක් ලබමින් ඉදිරියෙන් සිටියි. මෙම ඇස්තමේන්තු 3-7%ක දෝෂ ආන්තිකය සමග සබැඳි ය.



2024 මාර්තු සිට අගෝස්තු දක්වා රනිල් වික්‍රමසිංහගේ සහය ඉහළ යමින් පැවති අතර, එම කාලසීමාව තුළ අනුර කුමාර දිසානායක, සජිත් ප්‍රේමදාස සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට ලැබී ඇති සහයෝගයේ සුළු අඩුවීමක් දක්නට ලැබුණි.


ජනාධිපති අපේක්ෂකයන් අතර පවතින දැඩි තරගය පිළිබඳව IHP විධායක අධ්‍යක්ෂ, ආචාර්ය රවී රන්නන්-එළිය මෙසේ අදහස් දැක්වීය: “අපගේ අගෝස්තු මත විමසුමෙන් පෙන්නුම් කරන්නේ පළමු ගණන් කිරීමේ දී කිසිදු අපේක්ෂකයෙකුට මුළු ඡන්ද ප්‍රමාණයෙන් අඩකට ආසන්නව ලබා ගැනීමට නොහැකි වන ආකාරයට දැඩි තරගයක් පවතින බව, සහ මෙම තත්ත්වය මත කිසිදු අපේක්ෂකයෙකුට ඡන්දදායකයින්ගෙන් බහුතර බලයක් ලබා ගැනීමට නොහැකි වන බව යි. 2024 මැතිවරණය, දෙවන හා තෙවන මනාප ගණන් කිරීම මත තීරණය වන පළමු ජනාධිපතිවරණ ඡන්ද විමසීමවීමට වැඩි ඉඩක් ඇතිබව එයින් අදහස් වනවා. සෑම ඡන්දයක්ම වැදගත් බව සහතික කිරීම සඳහා මනාපයන් නිවැරදිව භාවිතා කරන ආකාරය පිළිබඳව ඡන්දදායකයින්ව දැනුවත් කිරීමේ උත්සාහයන් තවදුරටත් තීව්‍ර කිරීමට අපි සිවිල් සමාජයෙන් සහ මැතිවරණ කොමිසමෙන් ඉල්ලා සිටිනවා.”




අගෝස්තු මාසය සඳහා MRP ආකෘති ඇස්තමේන්තු විශ්ලේෂණය, එක් එක් අපේක්ෂකයාට සහය දක්වන පිරිසේ වෙනස්කම් හෙළි කරයි. අනුර කුමාර දිසානායකට තරුණයන්ගෙන් වඩාත් ප්‍රබලම සහයෝගයක් (53%) ලැබී තිබෙන අතර, සිංහල ඡන්දදායකයින්ගෙන් 42%ක සහයක් ලැබී තිබේ. වඩාත්ම ධනවත් ඡන්දදායකයින් තුනෙන් එක (38%) අතර අනුර කුමාර දිසානායක සහ රනිල් වික්‍රමසිංහ යන දෙදෙනාටම වැඩි සහයෝගයක් ලැබී ඇත. ඊට ප්‍රතිවිරුද්ධව, සජිත් ප්‍රේමදාස දරිද්‍රතම ඡන්දදායකයින් තුනෙන් එක (40%) අතර ඉදිරියෙන් සිටියි.

ශ්‍රී ලාංකික දෙමළ ජනතාව (55%) සහ වතු/ඉන්දීය දෙමළ ජනතාව (53%) යන දෙපාර්ශයෙන්ම අඩකට වඩා වැඩි පිරිසක් සජිත් ප්‍රේමදාසට සහාය ලබා දී ඇති අතර, මුස්ලිම් ජනතාවගෙන් තුනෙන් දෙකක් (71%) පමණ ඔහුට සහාය පළකර තිබේ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙත දක්වන ජනතා සහයෝගය වයසත් සමග වැඩි වී ඇති අතර, වයස අවුරුදු 60 සහ ඉහළ පුද්ගලයන්ගෙන් 43%ක සහයක් ලැබී ඇත.


**ජනවිකාස විචල්‍ය අනුව ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, 2024 අගෝස්තු (වැඩිහිටියන් %)**
අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**
2021 ඔක්තෝම්බර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත පදනම්ව, MRP සංඛ්‍යාන ආකෘතියක් භාවිතා කර අගෝස්තු මැද භාගය සඳහා කරන ලද ප්‍රක්ෂේපණයන් සමඟ ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇත.

අනුර කුමාර දිසානායක උතුරු හා නැගෙනහිර පළාත් හැර සෙසු පළාත්වල දී පෙරමුණ දැරූ අතර, උතුරු හා නැගෙනහිර පළාත්වල දී ඔහු සජිත් ප්‍රේමදාසට සහ රනිල් වික්‍රමසිංහට පිටුපසින් තෙවැනි ස්ථානයට පත්විය.


**පළාත අනුව ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, 2024 අගෝස්තු (වැඩිහිටියන් %)**
අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**
2021 ඔක්තෝම්බර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත පදනම්ව, MRP සංඛ්‍යාන ආකෘතියක් භාවිතා කර අගෝස්තු මැද භාගය සඳහා කරන ලද ප්‍රක්ෂේපණයන් සමඟ ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇත.

අනුර කුමාර දිසානායක සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ යන දෙදෙනාම, 2019 දී ගෝඨාභය රාජපක්ෂට සහයෝගය දැක්වූ ඡන්දදායකයින්ගෙන් විශාල ප්‍රමාණයක් දිනා ගැනීමට සමත්ව තිබේ. මෙම ඡන්දදායකයින්ගෙන් සජිත් ප්‍රේමදාසට සහාය දක්වන්නේ අටෙන් එකක් පමණි.

**අරගලය සහ පොහොසත් - දුප්පත් පරතරය පිලිබඳ ආකල්පයන් අනුව ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, 2024 අගෝස්තු (වැඩිහිටියන් %)**
අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?





සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP
2021 ඔක්තෝම්බර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත පදනම්ව, MRP සංඛ්‍යාන ආකෘතියක් භාවිතා කර අගෝස්තු මැද භාගය සඳහා කරන ලද ප්‍රක්ෂේපණයන් සමඟ ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇත.

අරගලය පිළිබඳ මහජන මතය අනුව ඡන්ද අභිප්‍රාය තවදුරටත් විශ්ලේෂණය කිරීමෙන් පෙනී යන්නේ, අගෝස්තු මාසයේ දී අරගලය පිළිබඳ අහිතකර ආකල්පයක් ඇති වැඩිහිටි පුද්ගලයන්ට (27%) වඩා එය පිළිබඳව හිතකර ආකල්පයක් ඇති වැඩිහිටියන් (37%) අනුර කුමාර දිසානායකට වැඩි සහායක් දැක්වීමට ඉඩක් ඇතිබව යි. ඊට ප්‍රතිවිරුද්ධව, අරගලය පිළිබඳ අහිතකර අදහස් පළ කරන අය ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ නාමල් රාජපක්ෂට වැඩි සහයක් දක්වන අතර, සජිත් ප්‍රේමදාස දෙපාර්ශවයෙන්ම සමාන සහායක් ලබාගනිමින් ස්ථානය රඳවාගෙන ඇත.

රටේ දුප්පත් පොහොසත් පරතරය හොඳ ද නරක ද යන්න පිළිබඳ ඡන්දදායක අදහස් සම්බන්ධයෙන් සංසන්දනාත්මක නමුත් දුර්වල සබඳතාවක් දක්නට ලැබුණි. දුප්පත්-පොහොසත් පරතරය ධනාත්මකව සැලකූ අයට වඩා සෘණාත්මකව සැලකූ අය අතර අනුර කුමාර දිසානායක ලකුණු 3කින් ඉදිරියෙන් සිටින අතර, ජනාපති රනිල් වික්‍රමසිංහ ලකුනු 4කින් පසුපසින් සිටියි.

ආචාර්ය රන්නන්-එළිය මෙසේ අදහස් දැක්වීය: “බොහෝ ශ්‍රී ලාංකිකයන් පිරිසකට අරගලය පිළිබඳ හිතකර දැක්මක් තිබෙන අතර, ශ්‍රී ලංකාව තුළ දුප්පත් පොහොසත් පරතරය වැඩිවෙමින් පවතින බවත්, එය නරක දෙයක් කියා ඔවුන් සිතනබවත් අපගේ මත විමසුම්වලින් පෙනී යනවා. නමුත්, කිසිදු ප්‍රමුඛ අපේක්ෂකයෙක් සිත්ගන්නා පණිවිඩයකින් මේ හැඟීම් සාධනීය ලෙස අමතා නොතිබීම පුදුමයට කරුණක්.”

**2019 ජනපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ ඉතිහාසයට අනුව ජනපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, 2024 අගෝස්තු (වැඩිහිටියන් %)**
අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP
2021 ඔක්තෝම්බර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත පදනම්ව, MRP සංඛ්‍යාන ආකෘතියක් භාවිතා කර අගෝස්තු මැද භාගය සඳහා කරන ලද ප්‍රක්ෂේපණයන් සමඟ ඇස්තමේන්තු ව්‍යුත්පන්න කර ඇත.

මෙම ඇස්තමේන්තු සඳහා IHP SLOTS Multilevel Regression and Poststratification (MRP) ආකෘතිය (01/2024 සංශෝධනය) භාවිතා කෙරෙයි. මෙම යාවත්කාලීන කිරීම සියලුම වැඩිහිටියන් සඳහා වන අතර, 2024 අගෝස්තු මාසයේ සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණ 1,153ක් ඇතුළුව, 2021 ඔක්තෝබර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත පදනම් වේ. අවිනිශ්චිතතාව ගණනය කිරීම සඳහා පුනරාවර්තන 100ක් සිදු කරන ලදී. අගෝස්තු මස සඳහා දෝෂ ආන්තිකය 1-7% ලෙස තක්සේරු කෙරෙයි. IHP ඉදිරි සතිවල දී පවත්වන සම්මුඛ පරීක්ෂණ සංඛ්‍යාව ඉහළ නැංවීමට සැලසුම් කරමින් සිටින අතර, මීළඟ ඇස්තමේන්තු වඩාත් නිරවද්‍ය වනු ඇතැයි බලාපොරොත්තු වේ.

IHP SLOTS MRP ක්‍රමවේදය තුළදී ප්‍රථමයෙන් 'multilevel statistical model’ මඟින්, ප්‍රතිචාර දක්වන්නන්ගේ විවිධ ලක්ෂණ සහ ඔවුන්ගේ යම් අදහසක් අතර සම්බන්ධය ඇස්තමේන්තු කරයි. මෙමඟින් මාස්පතා සිදුවන වෙනස්වීම් සුමට කිරීමට ද ලක් කරයි. මෙහිදී 'අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාට ද?’ යන අදහස පිළිබඳව විමසා ඇත. පසුව එය 2021 ඔක්තෝබර් සිට සෑම මාසයකම ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය පුරෝකථනය කිරීමට (‘post-stratification’) ජාතික ජනගහනයට ක්‍රමාංකනය කරන ලද විශාල දත්ත ගොනුවක් භාවිතා කෙරිණි. Multilevel modelහි පවතින අවිනිශ්චිතතාවන් පිළිබිඹු කිරීමට සහ දෝෂ ආන්තිකය ලබා ගැනීමට ආකෘතිය 100 වතාවක් ඇස්තමේන්තුකර ඇත. පසුගිය නිකුතුවෙන් පසුව තවත් දත්ත රැස් කළ බැවින් මෙම යාවත්කාලීනයේ පෙර මාසවල ඡන්ද අභිප්‍රාය ප්‍රතිඵල වෙනස්වී ඇති අතර මෙම වෙනස්කම් දෝෂ ආන්තික සීමාව තුළ පවතියි.

### Previous reports available from ihp.lk


Institute for Health Policy, April 2023, “AK Dissanayake (48%) leads Sajith Premadasa (37%) in Presidential Election voter preferences. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update March 2023”.
*Available at:* [https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf](https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf)

Institute for Health Policy, March 2024, “AK Dissanayake (53%) continues to lead Sajith Premadasa (34%) in Presidential Election voting intent in February 2024. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update February 2024”.
*Available at:*https://ihp.lk/press-releases/ak-dissanayake-53-continues-lead-sajith-premadasa-34-presidential-election-voting

Institute for Health Policy, April 2024, “Sajith Premadasa (41%) closes gap with AK Dissanayake (44%) in Presidential Election voting intent in March 2024. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update March 2024”.
*Available at:*https://ihp.lk/press-releases/sajith-premadasa-41-closes-gap-ak-dissanayake-44-presidential-election-voting-intent

Institute for Health Policy, May 2024, “Sajith Premadasa and AK Dissanayake tied with 39% support in Presidential Election voting intent in April 2024. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update April 2024”.
*Available at:*https://ihp.lk/press-releases/sajith-premadasa-and-ak-dissanayake-tied-39-support-presidential-election-voting

Institute for Health Policy, June 2024, “AK Dissanayake (39%) and Sajith Premadasa (38%) continue to bolster support in Presidential Election voting intent in May 2024. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update May 2024”.
*Available at:*https://ihp.lk/press-releases/ak-dissanayake-39-and-sajith-premadasa-38-continue-bolster-support-presidential

Institute for Health Policy, July 2024, “Sajith Premadasa (43%) leads as Presidential Election kicks off in June 2024, but within margin of error. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update June 2024”.

*Available at:*[https://ihp.lk/press-releases/sajith-premadasa-43-leads-presidential-election-kicks-june-2024-within-margin-error](https://ihp.lk/press-releases/sajith-premadasa-43-leads-presidential-election-kicks-june-2024-within-margin-error)

Institute for Health Policy, August 2024, “AK Dissanayake and Sajith Premadasa lead neck and neck in July voting intent, but support for Pres. Ranil Wickremesinghe surges. IHP/SLOTS MRP Presidential Election Voting Intention Update July 2024”.
*Available at:*[https://ihp.lk/press-releases/ak-dissanayake-and-sajith-premadasa-lead-neck-and-neck-july-voting-intent-support](https://ihp.lk/press-releases/ak-dissanayake-and-sajith-premadasa-lead-neck-and-neck-july-voting-intent-support)

## සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව

මෙම සමීක්ෂණය සැලසුම් කිරීම සහ පැවරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි පූර්ණ වගකීම දරයි. IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTSහි ප්‍රධාන විමර්ශක වන IHPහි ආචාර්ය රවී රන්නන්-එළිය, හාවඩ් විශ්වවිද්‍යාලයයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර, දශක තුනක් පුරා ලංකාව තුළ හා ලංකාවෙන් පිටත විවිධ මත විමසුම් සමීක්ෂණ සිදුකර තිබේ.

## විස්තරාත්මක ක්‍රමවේදය

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2024 සැප්තැම්බර් MRP ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ 2024 අගෝස්තු මාසයේ දී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 701ක් ඇතුළත්ව 2021 ඔක්තෝබර් 1 සිට 2024 සැප්තැම්බර් 02 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 19,721ක් මත වේ. රනිල් වික්‍රමසිංහ සහ සජිත් ප්‍රේමදාස සඳහා 4.4-6.4%ක, සහ අනුර කුමාර දිසානායක සහ නාමල් රාජපක්ෂ සඳහා 2.2-2.4%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

## අරමුදල් සැපයීම

දෙදහස් විසි එක වර්ෂයේ සිට **SLOTS** ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකයින් පරාසයක් සහාය දක්වා ඇති අතර, ඔවුන් අධ්‍යයනය සැලසුම් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හෝ වාර්තා කිරීමේ දී කිසිදු කාර්යයභාරයක් ඉටු නොකරයි. නීලන් තිරුචෙල්වම් භාරය, ආසියා පදනම, යුරෝපා කොමිසම, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ඕපන් සොසයටි ෆවුන්ඩේෂන් ආයතනය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් **SLOTS** සඳහා මීට පෙර අරමුදල් සපයා ඇත. වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැපයෙන්නේ වීලුකස් ස්ටිෆ්ටුන්ග් පදනම, අබුඩාබියේ නිව්යෝර්ක් විශ්වවිද්‍යාලයය, සහ **IHP** මහජන සුබසාධන පර්යේෂණ අරමුදල විසිනි. තව ද, සමීක්ෂණ සොයාගැනීම් අවශ්‍යයෙන්ම අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට **IHP** සම්බන්ධකර ගත හැකි ය.